

විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය

தொலைத் தொடர்பாடல் மற்றும் தகவல் தொழில்நுட்பவியல் அமைச்சு

Ministry of Telecommunication and Information Technology

ගරු විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගේ පණිවුඩය




2014 වසර මා විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍ය ධුරය දරන සිවුවන වසර ලෙස සනිටුහන් වේ. මෙම ධුරය දරන පළමු වැන්නා ලෙස මෙතෙක් පැමිණි ගමන ගැන ආඩම්බරයෙන් සිහි කළ හැක. එලදායි මහජන සේවයක් ඉටු කළ බවට සෑහීමකට පත්විය හැකි වීම හා එය සදාකල් මතකයේ රැඳෙනු ඇති බව මගේ විශ්වාසයයි. එවන් පසුබිමක 2014 වසර තුළ විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය හා එය යටතේ ඇති ආයතන මගින් ඉටු කරන ලද සේවාව හා ප්‍රගතිය දැක්වෙන මෙම වාර්තාවට විෂය භාර අමාත්‍යවරයා ලෙස පණිවිඩයක් නිකුත් කරනු ලැබීම භාග්‍යයක් ලෙස සලකමි.

තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකාවේ පාසල් දරුවන් පරිගණක දැනුමෙන් සවිබල ගැන්වීම සඳහා පාසල් පරිගණක විද්‍යාගාර (ඉ-ශිල්පාගාර) ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතියක් දියත් කර ඇති අතර 2014 වසර අවසානයේදී දිස්ත්‍රික්ක 07 ක් සඳහා පුර්ණ පහසුකම් සහිත පරිගණක විද්‍යාගාර 563ක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය මගින් කර ඇත. එමෙන්ම දිවයින පුරා උතුරු නැගෙනහිර ද ඇතුළුව නැණසල මධ්‍යස්ථාන 1005ක් ස්ථාපනය කර ඇත.රටේ සියළු පුරවැසියන්ගේ සේවාවන් පහසුකරලීම සඳහා විවිධ තොරතුරු තාක්ෂණ පද්ධති හඳුනාගෙන ඇත.

තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව ඉහළ නැංවීමේ ක්‍රියාවලිය හේතුකොට අන්තර්ජාතිකව ශ්‍රී ලංකාවට විශාල පිළිගැනීමක් අත්වූ අතර ප්‍රංශයේ ලියෝන් නුවර පැවත්වූ උත්සවයකදී බිල් හා මිලින්ඩා ගේට්ස් පදනමෙන් ශ්‍රී ලංකාවට සම්මානයක් පුදනු ලැබීය. තුටු පඬුරු ලෙස ඇමෙරිකානු ඩොලර් මිලියනයක මුදලක් හා එම වටිනාකමින් යුත් මෘදුකාංග ද ලබා දෙනු ලැබීය.

දැයට කිරුළ යන තේමාව යටතේ මෙම වසර තුළ කුලියාපිටිය නගරය කේන්ද්‍ර කොට ගත් ප්‍රදේශයක ඇති අධ්‍යාපනික ආයතන අලලා සංවර්ධන වැඩකටයුතු මෙම අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් සිදුවිය. මෙයින් ශිෂ්‍ය ප්‍රජාවට ඉමහත් ප්‍රයෝජන අත් වූ අතර මතු පරම්පරාවට කළ සංවර්ධන කටයුතු වූයේ කුලියාපිටිය වයඹ විශ්ව විද්‍යාලයට මිලියන 600ක වියදමින් ශ්‍රවණාගාරයක්, ක්‍රීඩාගාරයක්, නැනෝ තාක්ෂණ විද්‍යාගාරයක් හා ශිෂ්‍ය මධ්‍යස්ථානයක් ද කාර්මික විද්‍යාලයට මිලියන 60ක වියදමින් පරිපාලන සංකීර්ණයක් ද, කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලයට මිලියන 157 ක වියදමින් ශ්‍රවණාගාරයක් එයට පුටු හා දෙමහල් පුස්තකාලයක් ද ඉදි වීමය. මෙතෙක් පැවති දැයට කිරුළ වැඩ සටහන් යටතේ වැඩි වශයෙන් අධ්‍යයන කටයුතු සඳහා සළුල වැඩසටහන් ක්‍රියාත්මක වූයේ මෙම වසරේදී බව සඳහන් කරන්නේ ඉමහත් ආඩම්බරයෙනි.

මෙම සියළු ප්‍රයත්නයන් සාර්ථක කරගැනීමට කණ්ඩායම් හැඟීමෙන් යුතුව කටයුතු කරලීමට මූලිකත්වය සැපයූ අමාත්‍යාංශ ලේකම් තුමා ඇතුළු සියළුම ආයතන හා අංශ ප්‍රධානීන්ට ද සෙසු කාර්ය මණ්ඩලයට ද මෙහිදී කෘතඥතාවය පළ කරමි. මෙම සාර්ථකව ඉටුකිරීමට සියලු දිරිගැන්වීම් හා ශක්තිය ලබා දුන් අතිගරු ජනාධිපතිතුමාට ද මාගේ සහෝදර මැති ඇමතිවරුන්ට ද මාගේ ස්තුතිය පුද කරනු කැමැත්තෙමි.



රංජිත් සියඹලාපිටිය
ගරු විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍ය

අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවුඩය



විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයෙහි 2014 මූල්‍ය වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව ඔබ වෙත ගෞරවයෙන් ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව මගින් අමාත්‍යාංශයේ මූල්‍යය ප්‍රගතිය සහ භෞතික ප්‍රගතිය 2014 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරනු ලැබේ.

අමාත්‍යාංශයේ මෙහෙවර වන්නේ, මහජනයාගේ තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය ඉහළ නැංවීම, ශ්‍රී ලාංකීය තොරතුරු අන්තර්ගතය ප්‍රවලිත කිරීම හා නවීන තාක්ෂණය භාවිතයෙන් විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණික අංශය සංවර්ධනය කිරීම හා එම තාක්ෂණය ජනතාවට දැරිය හැකි මිලට සුලභව ලබා දීමෙන් සැමට ප්‍රවේශයක් ඇති කිරීමයි.

අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වන්නේ තොරතුරු තාක්ෂණ සන්නිවේදන නියෝජිත ආයතනය, ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුව යි.

ඉහත මෙහෙවර ඉටුකර ගැනීම සඳහා අමාත්‍යාංශය මගින් ප්‍රධාන තේමා ක්ෂේත්‍ර හතරක් තෝරා ගැනිණි.ඒවා නම්, තොරතුරු සන්නිවේදන අධ්‍යාපනය සහ කුසලතා ප්‍රවර්ධනය කිරීම, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශය සඳහා සම්බන්ධ වීම, ප්‍රශස්ත තොරතුරු තාක්ෂණ භාවිතාවන් දිරිගැන්වීම සහ තොරතුරු තාක්ෂණික ධාරිතාවය වැඩිදියුණු කිරීමයි.

ඒ අනුව අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘතීන් වන්නේ මිස්සක ඉ-නැණ පියස පාසල් පරිගණක ව්‍යාපෘතිය, නැණසල ග්‍රාමීය තොරතුරු තාක්ෂණ සන්නිවේදන මධ්‍යස්ථාන සහ ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය සම්බන්ධ ව්‍යාපෘති, දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ සම්පත් මධ්‍යස්ථාන ව්‍යාපෘතිය ආදියයි. එම ව්‍යාපෘති සියල්ල සැලසුම් කළ ආකාරයෙන් සියළුම ඉලක්ක මෙම මූල්‍ය වර්ෂය තුලදී සපුරාගෙන තිබේ.

එසේම අමාත්‍යාංශය මගින් දැයට කිරුළ ජාතික සංවර්ධන ව්‍යාපෘතිය හා ප්‍රදර්ශනය සංවිධානය කිරීම තුළින් 2014 වසරේ පුත්තලම, කෑගල්ල හා කුරුණෑගල දිස්ත්‍රික්ක තුළ ආර්ථික හා සමාජීය සංවර්ධනයක් ඇති කිරීමට හැකිවීම පිළිබඳ අප සතුටු වන්නෙමු.

එම කටයුතු සඳහා රුපියල් බිලියන1.7ක් ඇස්තමේන්තු කෙරිණි. එයින් රුපියල් බිලියන 1.5ක් රාජ්‍ය මුල්‍යය රෙගුලාසි සහ පැහැදිලි උපදෙස් වලට යටත්ව මෙම වර්ෂය තුලදී වියදම් කරමින් 88% ක පමණ ඉහළ ප්‍රගතියක් සාක්ෂාත් කරගැනීමට හැකි විය. මෙම ප්‍රගතිය මෑත කාලයේ ලැබූ පුළුල් ජයග්‍රහණයකි.

අමාත්‍යාංශයෙහි උපාය මාර්ගික සැලැස්ම අනුව ඉදිරි ජයග්‍රහණයන් ලභා කර ගැනීම සඳහා සැලසුම් කිරීම සහ අඛණ්ඩ ප්‍රගති සමාලෝචනය ව්‍යාපෘතීන්හි ඉලක්ක සපුරා ගැනීම සඳහා වැදගත් වී ඇත. අපගේ පාර්ශවකරුවන් සහ සමකාලීනයන් සමග කටයුතු කිරීම තවදුරටත් බලාපොරොත්තු වන අතර එහිදී සිහිතබා ගත යුතු කරුණක් වන්නේ අප විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රගතිය වෙනුවෙන් සැලකිලිමත් විය යුත්තේ ඇයිද යන්නයි.

අප ලභා කරගත් ප්‍රගතිය සම්බන්ධයෙන් මා අතිශය ආඩම්බර වෙමි. එසේම අප අමාත්‍යාංශයේ කාර්යයන් සඵල කර ගැනීම සඳහා ගරු ඇමතිතුමාගේ දේශපාලන නායකත්වයෙන් සහ මගපෙන්වීමෙන් කැප වූ අතිරේක ලේකම්, නිලධාරීන් සියළු දෙනා වෙනුවෙන් සහ ඔවුන්ගේ උත්සාහයන් වෙනුවෙන් මා ප්‍රශංසාව පල කරන අතර එමගින් දේශයේ පුරවැසියන් වෙත නවීන තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රශස්ථ පහසුකම් සහ දැනුම ලබාදීමට හැකි වී ඇත.

එස්.එම්.ගෝඨාභය ජයරත්න
ලේකම්

පටුන

	පිටුව
දැක්ම හා මෙහෙවර	1
අමාත්‍යාංශයෙහි අරමුණු	2
අමාත්‍යාංශයේ විෂයන් හා කාර්ය පැවරීම	3
අමාත්‍යාංශයේ ප්‍රධාන තේමා ක්ෂේත්‍ර	4
ආයතන ව්‍යුහය	5
මානව සම්පත්	6
සැලසුම් සහ සංවර්ධන ප්‍රවේශයන්	7
අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති	8
මිස්සක ඉ-නැණ පියස	9
හැඳින්වීම	10
අරමුණු හා ඉලක්ක	10
ව්‍යාපෘතියේ ප්‍රතිලාභ	11
මිස්සක ඉ-නැණ පියස ස්ථාපනය කිරීමේ ප්‍රගතිය	12
මිස්සක ඉ-නැණ පියස ව්‍යාපෘති	14
විවෘත කරන ලද පාසල් පරිගණක මධ්‍යස්ථාන / ඡායාරූප	15
මිස්සක ඉ-නැණ පියස ගුරු පුහුණුව	16
හැඳින්වීම , අරමුණු හා ඉලක්ක	16
ශිල්පාගාර සඳහා ගුරුවරුන් පුහුණු කිරීමෙහි සැලැස්ම සහ කාර්යසාධනය	17
නැණසල ව්‍යාපෘතිය	18
හැඳින්වීම	19
අරමුණු හා ඉලක්ක	19
නැණසල ස්ථාපනය කිරීමේ ප්‍රගතිය	20
නැණසල මධ්‍යස්ථානයන්හි ව්‍යාපෘති	22
මිස්සක දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ සම්පත් මධ්‍යස්ථාන	23
හැඳින්වීම	24
තොරතුරු තාක්ෂණ සම්පත් මධ්‍යස්ථානයක් පිහිටුවීමේ අරමුණු	24
ව්‍යාපෘතියේ ප්‍රතිලාභ	25
මධ්‍යස්ථාන පිහිටුවීමේ ප්‍රගතිය	26
මිස්සක දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ සම්පත් මධ්‍යස්ථාන ව්‍යාපෘති	27

පටුන

	පිටුව
නැණසල වැඩසටහන යටතේ තොරතුරු තාක්ෂණ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායනය මගින් ක්‍රියාත්මත කරන ලද අනෙකුත් ව්‍යාපෘති	28/29
ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම	30
දැයට කිරුළ	31
2013 දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන හා ප්‍රදර්ශනය	32
2014 දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන හා ප්‍රදර්ශනය	33
2015 දැයට කිරුළ	34
කොටවිලවත්ත ප්‍රදර්ශන භූමියේ සිදුකරන ඉදිකිරීම් ප්‍රගතිය	35
සරසවි පෙදෙස ප්‍රදර්ශන භූමියේ සිදුකරන ඉදිකිරීම් ප්‍රගතිය	36
ප්‍රදර්ශනයට සමගාමීව භූමියෙන් පිටත මාතර දිස්ත්‍රික්කය තුළ සිදුකරන ඉදිකිරීම්	37
2013 දැයට කිරුළ වැඩසටහනට සමගාමීව හාඩ් උසස් තාක්ෂණ ආයතනයේ ඉදිකිරීම්	38
විදුලි සංදේශ දෙපාර්තමේන්තුව	39/40
අමාත්‍යාංශයෙහි මුල්‍ය ප්‍රගතිය	41
හැදින්වීම	42
2014 වර්ෂයේ අමාත්‍යාංශයේ අයවැය සාරාංශය	43
අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ මෙහෙයුම් වැඩසටහන සඳහා පුනරාවර්තන සහ මූලධන වියදම් විස්තරය	44
මෙහෙයුම් වැඩසටහන, ව්‍යාපෘතිය **02** - පරිපාලන හා ආයතනික සේවා	45
සංවර්ධන වැඩසටහන, ව්‍යාපෘතිය **03** - තොරතුරු තාක්ෂණ සංවර්ධනය	46

දැක්ම

ඩිජිටල් තාක්ෂණයෙන් සවිබල වූ ශ්‍රී ලංකාවක් වෙත..

මෙහෙවර

මහජනයාගේ තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය ඉහළ නැංවීම, ශ්‍රී ලාංකීය තොරතුරු අන්තර්ගතය ප්‍රචලිත කිරීම හා නවීන තාක්ෂණය භාවිතයෙන් විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණයේ සංවර්ධනයෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය කලට, ජනතාවට දැරිය හැකි මිලට, දේශයෙහි සෑම තැන මනා සේවයක් ලබා දීමෙන් සැමට ප්‍රවේශයක් ඇති කිරීම.

අමාත්‍යාංශයෙහි අරමුණු

ජාතික ප්‍රතිපත්තීන් අනුව විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ විෂයයන්ට අදාල ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම.

1. ශ්‍රී ලාංකික ජනතාවගේ පරිගණක හා තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය 2016 වන විට 75% දක්වාද 2020 වර්ෂය වන විට 100% දක්වා ද ඉහළ නැංවීම

2. විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ සේවා නියුක්තිය 2016 වර්ෂය වන විට 100,000 දක්වාද 2020 වර්ෂය වන විට 250,000 දක්වා ද ඉහළ නැංවීම.

3. තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ ඉපයීම 2016 වර්ෂය වන විට බිලියන 1ක් දක්වා ද 2020 වර්ෂය වන විට ඇමෙරිකානු ඩොලර් බිලියන 5 දක්වා ද වර්ධනය කිරීම.

4. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය කිරීම දිරිගැන්වීම තුළින් රාජ්‍ය අංශයේ යහපාලනය ප්‍රවර්ධනය කිරීම.

5. විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ආයෝජන ප්‍රවර්ධනය

අමාත්‍යාංශයේ විෂයයන් හා කාර්යයන් පැවරීම

2010 නොවැම්බර් **22** දින හා අංක **1681/3** දරණ අතිවිශේෂ ගැසට්පත්‍රය අනුව විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයේ විෂයයන් සහ කාර්යයන් පවරා දී ඇත.

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කළ යුතු පනත්

- **2003** අංක **27** දරණ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත
- **2006** අංක **19** දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත
- **2008** අංක **33** දරණ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (සංශෝධිත) පනත
- **2011** අංක **21** දරණ විදුලි සංදේශ බදු පනත, **2013** අංක **8** දරණ විදුලි සංදේශ බදු (සංශෝධිත) පනත දැනට ක්‍රියාත්මකව පවතින හා වෙනත් අමාත්‍යාංශයක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇති සහ අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන් සඳහා අදාල අනෙකුත් සියලුම ව්‍යවස්ථාවන්

අමාත්‍යාංශයේ ප්‍රධාන තේමා ක්ෂේත්‍ර, 2014-2020

1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතය හා එම නිපුණතා වැඩි දියුණු කිරීම

- පාසල්වල පිහිටවනු ලබන මිස්සක ඉ-නැණ පියස පරිගණක විද්‍යාගාර පාදක කර ගනිමින් පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපන සංරචකය ප්‍රවර්ධනය කිරීමට සහාය වීම හා නැණසල, ග්‍රාමීය තොරතුරු සන්නිවේදන මධ්‍යස්ථාන මගින් ග්‍රාමීය මට්ටමේ ප්‍රජාවගේ තොරතුරු තාක්ෂණික සාක්ෂරතාවය සහතික කිරීම.
- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ රැකියාවන් හි නියුතු වුවන්ගේ, තොරතුරු තාක්ෂණික අධ්‍යාපනය වැඩිදියුණු කිරීම හා තොරතුරු තාක්ෂණ වෘත්තීය තත්වය සහතික කිරීම.
- ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වන වෘත්තීමය යාන්ත්‍රණයන් හඳුනාගැනීම හා ශක්තිමත් කිරීම මඟින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික අංශයෙහි වෘත්තීයභාවය ඉහළ නැංවීම.


2. තොරතුරු හා සංනිවේදන ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වන කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයන් හට නවෝත්පාදන බිහි කිරීම, තරඟකාරීබව ඉහළ නැංවීම හා ඵලදායිතා ප්‍රවර්ධනය සඳහා සහය වීම.

3. පළාත් හා ග්‍රාමීය මට්ටමේදී සුදුසු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික ක්‍රියාවලීන් භාවිතය සැලසුම්ගතව ප්‍රවර්ධනය කිරීම

- දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ සම්පත් මධ්‍යස්ථාන පිහිටුවීම මඟින් දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ සංවර්ධන සැලසුමක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම, එම සැලස්ම දිස්ත්‍රික් පරිපාලනය සමග බද්ධ කිරීම, ව්‍යවසාය කටයුතු සංවර්ධනය, පුහුණු කටයුතු ව්‍යාප්ත කිරීම,දත්ත ගබඩා කිරීම හා බෙදාහැරීම මගින් ජාතික සංවර්ධනය ට දායකත්වයක් ලබා දීම.

4. ජාතික හා උප ජාතික මට්ටමේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පර්යේෂණ හා සංවර්ධන හැකියාව ප්‍රවර්ධනය කිරීම

- ක්ෂේත්‍රයේ වෘත්තිකයන් හා ජාතික ආයතන ඒකාබද්ධව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතය හා අනාගත අවශ්‍යතා පිළිබඳ පර්යේෂණ පැවැත්වීම හා එම ප්‍රතිඵල ප්‍රාදේශීය මට්ටම සමග බද්ධ කිරීම.
- තොරතුරු භාවිතා කිරීම් හා ප්‍රතිලාභ සමීක්ෂණ මඟින් දත්ත හා තොරතුරු ඒකරාශී කිරීම
- අනුරූප පර්යේෂණ වැඩිදියුණු කිරීම


විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය
• ආයතන වැඩසටහන
අමාත්‍යවරයා
නියෝජ්‍ය අමාත්‍යවරයා
ලේකම්
අතිරේක ලේකම්
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
සහකාර ලේකම්
සහකාර අධ්‍යක්ෂ
සහකාර අධ්‍යක්ෂ
නියෝජ්‍ය අධ්‍යක්ෂ
තොරතුරු තාක්ෂණ නිලධාරි
ප්‍රධාන ගණකාධිකාරී
භාෂා පරිවර්ථක
ගණකාධිකාරී
විදුලි සංදේශ ඉංජිනේරුවන්
සංවර්ධන අංශය
තොරතුරු තාක්ෂණ අංශය
සැලසුම් අංශය
පාලන අංශය
ගිණුම් අංශය
අභ්‍යන්තර විගණන අංශය

මානව සම්පත්

අමාත්‍යාංශයේ විවිධ තනතුරුවලට අදාල අනුමත සංඛ්‍යාව, දැනට සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය හා පුරප්පාඩු සංඛ්‍යාව .

තනතුර	සේවය	අනුමත කාර්ය මණ්ඩලය	දැනට සිටින කාර්ය මණ්ඩලය	පුරප්පාඩු සංඛ්‍යාව
ලේකම්		01	01	-
අතිරේක ලේකම්	ශ්‍රී.ලං.ප.සේ. (විශේෂ)	01	01	-
ප්‍රධාන ගණකාධිකාරි	ශ්‍රී.ලං.ග.සේ.I	01	01	-
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්	ශ්‍රී.ලං.ප.සේ.I	01	01	-
සහකාර ලේකම්	ශ්‍රී.ලං.ප.සේ. III	01	01	-
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ	ශ්‍රී.ලං.ප.සේ. II/III	01	01	-
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ	ශ්‍රී ලං.ක්‍ර.සේ.II/III	01	01	-
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ	ශ්‍රී ලං.ඉ.සේ. II/III	01	01	-
ගණකාධිකාරි (අභ්‍යන්තර විගණන)	ශ්‍රී.ලං.ග.සේ. II/III	01	01	-
පරිපාලන නිලධාරි	රා.ක.ස.සේ. (අධිශ්‍රේණිය)	01	-	01
භාෂා පරිවර්තක	භාෂා පරිවර්තක සේ.	02	01	01
ලේකම්තුමාගේ සම්බන්ධීකරණ ලේකම්		01	01	-
තොරතුරු තාක්ෂණ නිලධාරි	ශ්‍රී.ලං.තො.හා සං.තා.සේ. II	26	01	25
සංවර්ධන නිලධාරි	සං.නි.සේ.	11	05	06
රාජ්‍ය කළමනාකරණ සහකාර	රා.ක.ස.සේ. I/II/III	22	18	04
කැමරා ක්‍රියාකරු	තාවකාලික	01	01	-
කාර්යාල සේවක	කාර්යාල සේවක සේවය I/II/III	10	06	04
රියදුරු	රියදුරු සේවය I/II/III	10	10	-
එකතුව		**93**	**52**	**41**

සැලසුම් සහ සංවර්ධන ප්‍රවේශයන්

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ ජාතික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති.

1. මිස්සක ඉ-නැණපියස

- පාසල් පරිගණක මධ්‍යස්ථාන 600 ස්ථාපනය කිරීමේ ඉලක්කය සඳහා ලඟා වීම
- ගුරු පුහුණුව

2. නැණසල ව්‍යාපෘතිය හා ඒ සම්බන්ධ අනෙකුත් ව්‍යාපෘති

- නැණසල නව මධ්‍යස්ථාන 1000 ස්ථාපනය කිරීමේ ඉලක්කය සඳහා ලඟා වීම
- නැණසල නව්‍යකරණ වැඩසටහන
- නැණසල භාවිතය වැඩි කිරීම
- ඉ- ස්වාභිමානී වැඩසටහන
- රෝහල් සෞඛ්‍ය තොරතුරු කළමනාකරණ පද්ධතිය
- 2014 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාවය සංගණනය
- ඉ-රාජ්‍ය පාලන තත්ව විශ්ලේෂණය/ මූලික දත්ත රැස්කිරීම
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්තයේ දැනුම වර්ධනය
- SME තොරතුරු තාක්ෂණ ව්‍යාපාර සංවර්ධනය
- IT/ITES වෙළඳ සහතිකකරණ වැඩසටහන
- තාක්ෂණික සහය වැඩසටහන
- වෘත්තිය නියමු හා ධාරිතා තුලන වැඩසටහන
- ජාතික සහතික කිරීමේ අධිකාරි ව්‍යාපෘතිය
- රජයේ ඉ-නායකත්ව ධාරිතා සංවර්ධනය
- රාජ්‍ය සේවා සජීවිකරණය සඳහා වන ඉලෙක්ට්‍රොනික සේවා හා ජංගම පාදක සේවා සංවර්ධනය
- මිස්සක දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම

3. මිස්සක දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන

4. විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ යන ක්ෂේත්‍රයන්ට සම්බන්ධිත විදේශීය වෘත්තිකයන් මෙරටට ගෙන්වා ගැනීමට වීසා බලපත්‍ර සඳහා නිර්දේශ ලබා දීම.

5. අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වන කමිටු

- තොරතුරු තාක්ෂණ ජාතික දත්ත කලමනාකරණ කමිටුව
- පුද්ගලික හා රාජ්‍ය අංශවල තොරතුරු තාක්ෂණ වෘත්තිකයින්ගේ ජාතික සම්බන්ධීකරණ කමිටුව
- තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය පිළිබඳ ජාතික කමිටුව

1.

6. දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන හා ප්‍රදර්ශනය

විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති

- මිස්සක ඉ නැණපියස
- නැණසල ව්‍යාපෘතිය
- මිස්සක දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන
- ඉ රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම
- දැයට කිරුළ


මිස්සක
ඉ-නැණ පිය ස
மிஸ்ஸக இ-நெண பியச
MISSAKA e-NENA PIYASA

මිස්සක ඉ-නැණ පියස ව්‍යාපෘතිය

හැඳින්වීම

ග්‍රාමීය පාසල්වල තොරතුරු තාක්ෂණ පහසුකම් නංවාලීම සඳහා පාසල් පරිගණක විද්‍යාගාර ඉදිකිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කෙරේ.

අරමුණු හා ඉලක්ක

මෙම ව්‍යාපෘතියෙහි සුවිශේෂී අරමුණු වන්නේ පාසල් සිසුන් සඳහා තොරතුරු තාක්ෂණය වෙත පහසු ප්‍රවේශයක් ලබා දීම, තොරතුරු තාක්ෂණ දැනුම ඉහළ නැංවීම, අනාගත රැකියා අවස්ථා සුරක්ෂිත කරලීමයි.

ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය 2016 වර්ෂය වන විට 75% දක්වා ඉහළ නැංවීම ප්‍රධාන ඉලක්කය වේ.

මිස්සක ඉ නැණ පියස පාසල් පරිගණක විද්‍යාගාරයක් ස්ථාපනය කිරීමේදී ලබාදෙනු ලබන උපකරණ.

	උපකරණය	ප්‍රමාණය
1	පරිගණක යන්ත්‍ර	10
2	මුද්‍රණ යන්ත්‍ර	01
3	ස්කෑනර් යන්ත්‍ර	01
4	බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය හා තිරය	01
5	පරිගණක ජාලය	01
6	පරිගණක පුටු	20
7	පරිගණක මේස	10

මිස්සක ඉ-නැණපියස පාසල් පරිගණක විද්‍යාගාරයක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 1.7ක පිරිවැයක් විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය විසින් දරනු ලබයි.

2014 වර්ෂය තුළ ව්‍යාපෘතිය සඳහා දරනු ලැබූ මුළු පිරිවැය රු.මි.510 කි.

ව්‍යාපෘතියේ ප්‍රතිලාභ

- ජාතික මට්ටමේ තොරතුරු තාක්ෂණ සාක්ෂරතා අගය ඉහළ නැංවීම සඳහා දායක වීම.


- 2014 වසර වන විට 'මිස්සක ඉ - නැණ පියස' පාසල් පරිගණක ව්‍යාපෘතිය මගින් පාසල් සිසුන් 150,000 කට පමණ පරිගණක අධ්‍යාපන පහසුකම් ලබා දීමට කටයුතු කිරීම.

- 2014 වර්ෂය වන විට සමස්ථ මිස්සක ඉ නැණපියස පරිගණක මධ්‍යස්ථාන 600ක් ඉදිකිරීමට සැලසුම් කර තිබූ අතර එම ඉලක්කය ඉක්මවා එම වර්ෂයේදී පරිගණක මධ්‍යස්ථාන 605ක් ඉදිකර අවසන් විය. 2012 – 2013 වර්ෂ වල පරිගණක මධ්‍යස්ථාන 164ක් සිසු අයිතියට පත් කරන ලද අතර 2014 වර්ෂය තුල පරිගණක මධ්‍යස්ථාන 441ක් ඉදිකිරීමට සැලසුම් කරන ලදී.එයින් මධ්‍යස්ථාන 303ක් 2014 වර්ෂයේදී සිසු අයිතියට පත් කෙරිනි. ඉතිරි මධ්‍යස්ථාන 138 න් 96ක් සම්පූර්ණ කොට විවෘත කිරීමට නියමිතව තිබූ අතර 42ක වැඩ ක්‍රියාත්මක වෙමින් පැවතිනි.

- තොරතුරු තාක්ෂණ ගුරුවරුන්ගේ දැනුම වර්ධනය හා ඔවුන් වෙත ඉහළ මට්ටමේ පුහුණුවක් ලැබීම සිදු වී ඇත.

- ජාතික සංවර්ධන ක්‍රියාවලියේදී තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ දායකත්වය ඉහළ නැංවීම සිදු වී ඇත.

මිස්සක ඉ-නැණ පියස ස්ථාපනය කිරීමේ ප්‍රගතිය




මෙම ව්‍යාපෘතිය මගින් 2014 වර්ෂයේ දෙසැම්බර් 31 දිනය වන විට මිස්සක **ඉ-නැණ** පියස පාසල් පරිගණක මධ්‍යස්ථාන 605 ක් ස්ථාපිත කර ඇත.

මිස්සක ඉ-නැණ පියස පිහිටුවීමේ ප්‍රගතිය

	දිස්ත්‍රික්කය	ඉලක්කය	විවෘත කළ සංඛ්‍යාව	ක්‍රියාත්මක වෙමින් පවතින
1	කුරුණෑගල	17	17	
2	පුත්තලම	11	11	
3	හම්බන්තොට	17	17	
4	ගම්පහ	7	7	
5	වවුනියාව	5		5
6	මාතර	10	10	
7	ගාල්ල	10	10	
8	රත්නපුර	12	12	
9	කොළඹ	13	13	
10	කෑගල්ල	219	217	2
11	මාතලේ	11	11	
12	මහනුවර	2	2	
13	මඩකලපුව	15	15	
14	ත්‍රිකුණාමලය	15	15	
15	පොලොන්නරුව	16	16	
16	අම්පාර	125	90	35
17	අනුරාධපුර	100	100	
	එකතුව	**605**	**563**	**42**

මිස්සක ඉ-නැණ පියස පරිගණක මධ්‍යස්ථාන ව්‍යාප්තිය



විවෘත කරන ලද පාසල් පරිගණක මධ්‍යස්ථාන



කෑ. ඇරැගම කණිෂ්ඨ විද්‍යාලය



කෑ.දෙහි. බොරලංකඩ මහා විද්‍යාලය



උහන - වැරන්කැටගොඩ විද්‍යාලය අම්පාර



ධීරානන්ද විද්‍යාලය - බූස්ස, ගාල්ල



කෑ.මාව පල්ලිපෝරුව මුස්ලිම් විද්‍යාලය.



කෑ.ගලි. කනන්ගමුව රාජසිංහ මහා විද්‍යාලය

මිස්සක ඉ-නැණ පියස ගුරු පුහුණුව





කෑගල්ල දිස්ත්‍රික්කයේ ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන

හැඳින්වීම

මෙම වැඩසටහන යටතේ ස්ථාපිත කරනු ලබන සෑම මිස්සක ඉ-නැණ පියසක් සඳහා ගුරුවරුන් දෙදෙනෙකු බැගින් පුහුණු කරනු ලැබේ.

මෙම පරිගණක ගුරු පුහුණු කටයුතු සිදුකරනු ලබනුයේ මහරගම 'ජාතික අධ්‍යාපන ආයතනය', 'මයික්‍රොසොෆ්ට් සමාගමේ' ශ්‍රී ලංකා ශාඛාව, සබරගමුව හා නැගෙනහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගිනි.

අරමුණු හා ඉලක්ක

ඉ-ශිල්පාගාර සඳහා ගුරුවරුන් පුහුණු කිරීමේ ව්‍යාපෘතියේ අරමුණු

- ස්ථාපිත කරනු ලබන මිස්සක ඉ-නැණ පියසෙහි පරිගණක හා එම පරිගණක පැකේජ නිවැරදිව ව්‍යාපෘතියෙහි අරමුණු සාධනය සඳහා භාවිතා කිරීම.
- ඉගැන්වීම් කාර්යය ක්‍රමවත්ව සිදුකිරීම සඳහා ගුරුවරුන් වෙත මූලික පුහුණුව ලබාදීම
- ව්‍යාපෘතිය හා සම්බන්ධ ගුරුවරුන්ගේ දැනුම වර්ධනය කිරීම.
- ව්‍යාපෘතියෙහි තිරසර බව ආරක්ෂා කිරීම.

මිස්සක ඉ නැණපියස සඳහා ගුරුවරුන් පුහුණු කිරීමෙහි සැලැස්ම සහ කාර්ය සාධනය

	මිස්සක ඉ- නැණ පියස මධ්‍යස්ථාන		ගුරු පුහුණුව		
	දිස්ත්‍රික්කය	2014 ඉලක්කය	පුහුණුව සඳහා සැලසුම් කළ ගුරුවරු සංඛ්‍යාව	ප්‍රගතිය	
				පුහුණුව සම්පූර්ණ කළ ගුරුවරු සංඛ්‍යාව	වියදම (රු.)
1	කෑගල්ල	169	302	259	1,493,700.40
2	ත්‍රිකුණාමලය	14	30	-	-
3	පොලොන්නරුව	16	32	-	-
4	මඩකලපුව	15	30	-	-
5	අම්පාර	115	250	35	93,927.00
6	හම්බන්තොට	15	18	-	-
7	අනුරාධපුර (2012 වසර)	-	600	600	1,620,600.00
	එකතුව	**344**	**1,262**	**894**	**3,208,227.40**


නැණසල
அறிவகம் - Nenasala
විශ්ව දැනුම ගමට உலக அறிவு கிராமத்திற்கு

නැණසල ව්‍යාපෘතිය

2014 වර්ෂයේදී ඇමරිකාවෙ හි 'බිල් සහ මිලින්ඩා ගේට්ස්' පදනම මගින් නැණසල ලෝකයේ අති සාර්ථකම ග්‍රාමීය තොරතුරු මධ්‍යස්ථාන ව්‍යාපෘතිය ලෙස "අන්තර්ජාතික ඉගෙනුම් සඳහා ප්‍රවේශය" සම්මානය ප්‍රදානය කිරීම මගින් ගෞරවයට පාත්‍ර කරන ලදී.

හැදින්වීම

2005 වර්ෂයේ ජනවාරි 01 දින කතරගම, කිරිවෙහෙරින් ප්‍රථම ග්‍රාමීය තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය වන "නැණසල මධ්‍යස්ථානය" ආරම්භ කරන ලදී. මෙම වර්ෂයේ නැණසල ලෝකයේ අති සාර්ථකම ග්‍රාමීය තොරතුරු මධ්‍යස්ථාන ව්‍යාපෘතිය ලෙස 'බිල් ඇන්ඩ් මිලින්ඩා ගේට්ස්' පදනම මගින් ජාත්‍යන්තර ඇගයීමට ලක් විය.

නැණසල ව්‍යාපෘතිය 'ඉ-ශ්‍රී ලංකා' වැඩසටහනෙහි ප්‍රධාන උප ව්‍යාපෘතියක් වේ. 'ඉ-ශ්‍රී ලංකා' ව්‍යාපෘතියෙහි අරමුණ වන්නේ සියලුම ජනතාව සඳහා තොරතුරු හා සන්නිවේදන ක්ෂේත්‍රයන්හි පහසු ප්‍රවේශයක් නිර්මාණය කිරීමයි.

තොරතුරු හා සන්නිවේදන අංශය දියුණු කිරීම මගින්

- ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහය ශක්තිමත් කිරීම
- ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම හා
- සමාජීය හා ආර්ථික සංවර්ධනය අපේක්ෂා කරනු ලැබේ.

අරමුණු හා ඉලක්ක

ග්‍රාමීය ප්‍රදේශ වල ජනතාව සඳහා තොරතුරු හා සන්නිවේදන ක්ෂේත්‍රයන්හි පහසු ප්‍රවේශයක් ඇති කිරීම හා සේවාවන් දරාගත හැකි මිලකට ලබා දීම මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ.

ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවට අන්තර්ජාලයට පිවිසීමට අවස්ථාව ලබාදීමත්, ඔවුන්ට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවාවන් භාවිතා කිරීමට දිරි දීමත්, සන්නිවේදන සම්බන්ධතා වලට අවස්ථා සලසමින් ග්‍රාමීය ජන කණ්ඩායම්වලට බලපෑම්කරන රාජ්‍ය සැලසුම් කරවීමත්, සංවර්ධන ආයතනවල ශිල්පීය විශේෂඥයින්ට, අධ්‍යාපනවේදීන්ට සහ වෙනත් අයට ගැමි ජනයා සමඟ සංවාදය වැඩි දියුණු කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීමත් නැණසල ව්‍යාපෘතියේ අරමුණු අතර වේ.

සමාජ සංවිධාන, පුස්තකාල, ගොවි සංවිධාන සහ පූජනීය ස්ථාන ආශ්‍රිතව මෙම නැණසල මධ්‍යස්ථාන ස්ථාපිත කරනු ලැබේ.

නැණසල මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමේදී පහත දැක්වෙන පරිදි පරිගණක හා උපාංග ලබා දෙනු ලැබේ.

	උපකරණය	ප්‍රමාණය
1	පරිගණක යන්ත්‍ර හා අනෙකුත් උපාංග	04
2	ඡායා පිටපත් යන්ත්‍ර	01
3	රැහැන් රහිත පිවිසුම් පද්ධති	01

2014 වසරේදී නැණසල මධ්‍යස්ථාන 1000ක් පිහිටුවීම මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන ඉලක්කය වූ අතර, නැණසල නව්‍යකරණ වැඩසටහන හා භාවිතය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ද 2014 වර්ෂයේ දී ක්‍රියාත්මක විය. ඒ අනුව 2014 වර්ෂයේ දී ඉලක්කය අභිබවා යමින් නැණසල මධ්‍යස්ථාන 1005 විවෘත කරන ලදී.

'නැණසල' පරිගණක මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා රුපියල් මිලියන 01ක අවම පිරිවැයක් දරනු ලැබේ.


2014 වර්ෂයේ සැලසුම්

නැණසල පිහිටුවීමේ ඉලක්කය වන මධ්‍යස්ථාන 1000 සම්පූර්ණ කිරීම සඳහා 2014 වර්ෂය තුළ දිස්ත්‍රික්ක 25 ක **නැණසල** පරිගණක මධ්‍යස්ථාන 259 ක් ස්ථාපිත කිරීමට සැලසුම් කෙරිණි.

නැණසල මධ්‍යස්ථාන 100 නව්‍යකරණයට ලක් කිරීම.

භාවිතය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ද මෙම වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීම.

නැණසල ස්ථාපනය කිරීමේ ප්‍රගතිය




2014 වර්ෂයේ තෙවැනි කාර්තුව තුළ දී නැණසල මධ්‍යස්ථාන 25 නව්‍යකරණයට ලක් කිරීම සිදු කර ඇත

නැණසල මධ්‍යස්ථාන පිහිටුවීමේ ප්‍රගතිය - දිස්ත්‍රික් මට්ටමෙන්

	දිස්ත්‍රික්කය	ඉලක්කය	විවෘත කළ	ක්‍රියාත්මක
1	අම්පාර	60	51	3
2	අනුරාධපුර	66	61	2
3	මඩකලපුව	42	27	2
4	බදුල්ල	45	55	4
5	කොළඹ	39	33	8
6	ගාල්ල	57	47	5
7	ගම්පහ	39	29	2
8	හම්බන්තොට	36	38	3
9	යාපනය	45	30	
10	කළුතර	42	38	1
11	මහනුවර	60	71	2
12	කෑගල්ල	40	89	3
13	කුරුණෑගල	90	75	5
14	මන්නාරම	15	9	
15	මාතර	48	48	2
16	මාතලේ	33	28	1
17	මොණරාගල	33	59	1
18	නුවරඑළිය	15	30	3
19	පොළොන්නරුව	21	32	1
20	පුත්තලම	48	39	3
21	රත්නපුර	51	51	6
22	ත්‍රිකුණාමලය	33	36	1
23	වව්නියාව	12	14	
24	මුලතිව්	18	9	
25	කිලිනොච්චි	12	6	1
	එකතුව	1000	1005	59

නැණසල මධ්‍යස්ථානයන්හි ව්‍යාප්තිය




දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය
மாவட்ட தகவல் தொழில்நுட்ப நிலையம்
District Information Technology Centre

මිස්සක දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ සම්පත් මධ්‍යස්ථාන

හැදින්වීම

විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකාව තුළ තොරතුරු තාක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් හඳුනාගත් දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් පරිපාලනය සමග ඒකාබද්ධව මිස්සක දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා පියවර ගන්නා ලදී.

දිවයින පුරා මෙවැනි මධ්‍යස්ථාන 25ක් පිහිටුවීමට සැලසුම් කර ඇති අතර 2014 වර්ෂයේ ඉලක්කය වුයේ මධ්‍යස්ථාන 10 ක් පිහිටුවීම යි.

මෙම මධ්‍යස්ථාන මගින් තොරතුරු සන්නිවේදන තාක්ෂණික අංශයට අනුබද්ධිත සියළුම සේවා සැපයීම්, දත්ත ගබඩා කිරීමේ පහසුකම් ලබා දීම, දත්ත සකස් කිරීම, විශ්ලේෂණය කිරීම සහ බෙදා හැරීම සිදු කරනු ලැබේ.

එහිදී එම සේවා සපයනු ලබන ආයතන වලට මෙන්ම එම සේවය සලසන සම්පත් දායකයන්ට අවශ්‍ය සියළුම තොරතුරු තාක්ෂණ අවශ්‍යතාවයන්ද එම මධ්‍යස්ථාන වලදී ලබාගැනීමට හැකිවීම විශේෂත්වයකි.

තොරතුරු තාක්ෂණ සම්පත් මධ්‍යස්ථානයක් පිහිටුවීමේ අරමුණු

මෙහි මූලික අරමුණ වන්නේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සාමූහික මැදිහත්වීම හා ආයෝජනය තුලින් ප්‍රාදේශිය හා ග්‍රාමීය සංවර්ධනය ඇතිකිරීම/ තොරතුරු තාක්ෂණ අවශ්‍යතාවය ශක්තිමත් කිරීම හා එතුලින් රැකියා අවස්ථා ඇති කිරීම හා ජනතාවගේ ආදායම් තත්ත්වය ඉහල නැංවීමට අවශ්‍ය පසුබිම සැලසීමයි.

දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ සංවර්ධන සැලැස්මක් සකස් කිරීම

දිස්ත්‍රික්කය තුළ තොරතුරු තාක්ෂණ අංශයේ ප්‍රවර්ධනය සඳහා ගතයුතු ක්‍රියාමාර්ග, පවතින ගැටළු පිළිබඳ අධ්‍යයනය කිරීම මගින් සකස් කරන ලද දිගුකාලීන සැලැස්මකි.

ව්‍යාපෘතියේ ප්‍රතිලාභ

මෙම ව්‍යාපෘතිය මගින් පහත පරිදි සෘජු හා වක්‍ර ප්‍රතිලාභ ලබා ගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

- සියළුම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවාවන් එකම ස්ථානයකින් ලබා ගැනීමට අවස්ථාවක් සැලසීම
- ජාතික මට්ටමේ රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයේ ආයතන සහ දිස්ත්‍රික්කය තුල ඇති අනෙකුත් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන සම්බන්ධීකරණය කිරීම
- තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය ඉහළ නැංවීම
- ප්‍රාදේශීය පරිපාලනය හා සංවර්ධනය සඳහා තොරතුරු තාක්ෂණ සහාය ලබාගැනීම.
- තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ව්‍යාපාර බාහිරකරණ කටයුතු
- සෘජු රැකියා අවස්ථා ඇති කිරීම.
- තොරතුරු තාක්ෂණ අංශයේ මානව සම්පත් සංවර්ධනය කිරීම

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරීගේ කාර්යභාරය

මධ්‍යස්ථානය හා අමාත්‍යාංශය වෙනුවෙන් දිස්ත්‍රික්කය තුළ සම්බන්ධීකරණය සිදුකිරීම හා e-DS වැඩසටහන ක්‍රියාවට නැංවීමට දායක වීම.

සියළුම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික වැඩසටහන් දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සම්බන්ධීකරණය කෙරේ.

මධ්‍යස්ථාන පරිපාලනය

මෙම දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ සම්පත් මධ්‍යස්ථානයේ පරිපාලනය කමිටුවක් මගින් සිදු කරනු ලැබේ. එම කමිටුව, දිස්ත්‍රික් ලේකම්, මධ්‍යස්ථානය පිහිටුවන කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්, තොරතුරු තාක්ෂණ විෂය ක්ෂේත්‍රයේ විශේෂඥයෙක්, විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ නිලධාරි, අධ්‍යාපන ක්ෂේත්‍රයේ දිස්ත්‍රික් නියෝජිතයෙක්, ප්‍රජා නියෝජිතයෙක් හා ප්‍රදේශයේ සිටින තොරතුරු තාක්ෂණ දැනුම ඇති තරුණයින්/ උපාධිධාරීන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ.

මධ්‍යස්ථාන පිහිටුවීමේ ප්‍රගතිය


විවෘත කළ, ඉදිවෙමින් පවතින හා යෝජිත මිස්සක දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ සම්පත් මධ්‍යස්ථාන

	පළාත	දිස්ත්‍රික්කය	ප්‍රගතිය
1	උතුර	යාපනය	ක්‍රියාත්මක වේ
2		මන්නාරම	ක්‍රියාත්මක වේ
3	නැගෙනහිර	අම්පාර	ක්‍රියාත්මක වේ
4	උතුර	වවුනියාව	ගොඩනැගිල්ල අළුත්වැඩියා කර ඇත
5	උතුරු මැද	පොළොන්නරුව	2015 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත
6	ඌව	මොණරාගල	
7	වයඹ	පුත්තලම	විවෘත කිරීමට සුදානම් කර ඇත
8	බස්නාහිර	කළුතර	විවෘත කිරීමට සුදානම් කර ඇත
9	දකුණ	ගාල්ල	විවෘත කිරීමට සුදානම් කර ඇත.
10	මධ්‍යම	මාතලේ	විවෘත කිරීමට සුදානම් කර ඇත.
11	සබරගමුව	කෑගල්ල (ගලිගමුව)	අදාළ ගොඩනැගිල්ලේ පළමු මහල ඉදිවෙමින්



අම්පාර දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ සම්පත් මධ්‍යස්ථානය

මිස්සක දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ සම්පත් මධ්‍යස්ථාන ව්‍යාප්තිය



නැණසල වැඩසටහන යටතේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මගින් යෝජිත සහ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති

	වැඩසටහන	ප්‍රගතිය	වෙන්කළ මුදල	වියදම් කළ මුදල 2014.12.31 රු.මිලියන
1	ඉ - ස්වාභිමානී	ජාතික මට්ටමේ තරඟයක් පවත්වා ත්‍යාග ලබා දෙන ලදී ආයතන 254ක් සඳහා අයදුම්පත් කැඳවූ අතර ජයග්‍රහණ 25ක් දෙනෙකු සඳහා ත්‍යාග ලබා දෙන ලදී. වෙබ් පිටුව නැවත නිර්මාණය කරන ලදී	6.62	8.33
2	රෝහල් සෞඛ්‍ය තොරතුරු කළමනාකරණ පද්ධතිය	මූලික සක්‍යතා අධ්‍යන වාර්තා සකස් කර ඉදිරිපත් කිරීම	2.90	0.20
3	පුරාවිද්‍යා ස්ථාන අනුරූපණය	ප්‍රමාණවත් කාලයක් නොමැති නිසා ක්‍රියාත්මක නොකරන ලදී	10.50	-
4	2014 තොරතුරුහා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාවය සංගණනය	ප්‍රමාණවත් කාලයක් නොමැති නිසා ක්‍රියාත්මක නොකරන ලදී	12.91	-
5	ඉ-රාජ්‍ය පාලන තත්ව විශ්ලේෂණය/ මූලික දත්ත එකතු රැස්කිරීම	ප්‍රමාණවත් කාලයක් නොමැති නිසා ක්‍රියාත්මක නොකරන ලදී	7.08	-
6	කර්මාන්තයේ දැනුම වර්ධනය	පහත සඳහන් පුහුණු වැඩසටහන් පවත්වා වෘත්තිකයන් පුහුණු කර ඇත. Training on Big Data and Hadoop (43 Professionals) Hybrid Mobile Application Development (52 Professionals) Inventing, Innovating and Patenting (26 Professionals) Writing and Generating Patents (38 Professionals) Technical Writing Training (27 Professionals) Presentation Skills training (50 Professionals) COMPTIA cloud essentials (52 Professionals)	9.99	13.8
7	SME තොරතුරු තාක්ෂණ ව්‍යාපාර සංවර්ධනය	සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කරුවන් සම්බන්ධ කර (Infotel) ප්‍රදර්ශනය පැවැත්වීම.	5.22	1.18
8	IT/ITES වෙළඳ සහතිකකරණ වැඩසටහන	පහත සඳහන් ආකාරයට වෙළඳ සහතික පත්‍ර ලබා දී ඇත. Microsoft Certifications (233 individuals) Cisco Certifications (326 individuals) Oracle Certifications (120 individuals) Red Hat Certifications (137 individuals)	8.12	15.36
9	තාක්ෂණික සහය වැඩසටහන	Seed funding (10 companies),LEAN Startup Workshop (12 individuals), Blue Ocean Workshop (11 individuals),UI/UX Workshop (12 individuals),Security Essentials Workshop (11 individuals),MS Cloud Economics Workshop (6 individuals),Selenium workshop (7 individuals),MS BizSpark Workshop (10 individuals),MS Test Automation Workshop (13 individuals),Finance Workshop (24 individuals),Legal Workshop (9 individuals),UNICEF Hackathon (150 individuals), WCY Spiralation Hackathon (88 individuals),4YFN/MWC (6 companies)	12.50	11.87

නැණසල වැඩසටහන යටතේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මගින් යෝජිත සහ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති

10	වෘත්තිය නියමු හා ධාරිතා තුලනය	පහත සඳහන් නගරවල වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් පවත්වා ඇත Career Fair in Galle (1100 students) Career Fair at INFOTEL Colombo (5000 students) Career Fair in Jaffna (2500 students) Workshop for teachers and Principles in Northern province (120 teachers/Principals)	8.70	7.13
11	රජයේ ඉ-නායකත්ව ධාරිතා සංවර්ධනය	පහත සඳහන් වැඩමුළු පවත්වා ඇත. government Certificate course Workshops for Government executives in District and Divisional Administration Residential government workshop for Senior Government officials and CIOs Workshop on government strategy for GoSL CIOs	61.00	12.30
12	රාජ්‍ය සේවා සජීවිකරණය සඳහා වන ඉලෙක්ට්‍රොනික සේවා හා ජංගම පාදක සේවා සංවර්ධනය	රාජ්‍ය ආයතන සඳහා පහත් සඳහන් වැඩසටහන් හඳුන්වා දී ඇත. •Management of 50 e-service / services offered by 23 government organization •Development of key e-Services offered by Sri Lanka Police and Department of Commerce, Development of five mobile apps offered by Key government organization such as CMC , ETF, Department of motor Traffic •Management of vehicle revenue License application in western province and southern province, Management of Lanka Gate middleware infrastructure and its core component such as gov SMS, Country portal, Payment Service •Upgrading of 13 government organization websites offering 20 online services , and making it mobile complaint, Consolidating government official web portal with government service portal, Computers for Government Lanka Cloud administrative staff,	100.00	47.10
13	නැණසල	නැණසල මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම	225.00	172.40
14		පවතින නැණසල ප්‍රතිනිර්මාණය කිරීම	50.00	58.92
15	උපායමාර්ගික සන්නිවේදනය	නැණසල ව්‍යාපෘතිය සඳහා වෙළඳ ප්‍රචාරන කටයුතු	22.00	22.00
	එකතුව		**542.54**	**370.58**


ඉ - රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් සකස් කරන ලද හෝ යාවත්කාලීන කරන ලද වෙබ් පිටු



ලංකා රාජ්‍ය ජාලය



ලංකා ද්වාරය




රාජ්‍ය ආයතන වෙබ් අඩවි සංවර්ධනය හා සංග්‍රහන ගත කිරීම



රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය



මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව



තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය


දැයට කිරැළි

දැයට කිරුළ

අරමුණු සහ ඉලක්ක

කුටුම්භය ගම ප්‍රදේශය යන තෙවැදෑරුම් මට්ටම් කේන්ද්‍ර කොටගත් ප්‍රජාව අවශ්‍යතා ඉලක්ක කරගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ එම ප්‍රදේශවල ජනතාවගේ ආර්ථික, සමාජීය, සංස්කෘතික හා පරිපාලන ගැටලු නිරාකරණය කරගැනීම යන පුළුල් අරමුණු මුල් කරගෙන මෙම ජාතික ප්‍රදර්ශනය පැවැත්වේ.

2013 දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන හා ප්‍රදර්ශනය

2013 වසරෙහි දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය අම්පාර දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගනිමින් පැවත් වූ අතර රු.බි.1.27 ඉදිකිරීම් 2013 – 2016 මධ්‍යකාලීන අයවැය රාමුව යටතේ සිදු කරමින් පවතී. ඒ යටතේ පහත දැක්වෙන ප්‍රගතිය අත්කර ගෙන ඇත.

	ගොඩනැගිල්ලේ නම	ඇස්තමේන්තුගත මුදල (රු.මි.)	නිම කිරීමට අපේක්ෂිත කාල වකවානුව	ඉදිකිරීම් කරන ආයතනය
01	නේවාසිකාගාරය	235.9	2014.11.20	*රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව*
02	ක්‍රීඩාගාරය	188.1	2016	
03	නේවාසිකාගාරය	113.1	2014 දෙසැම්බර්	*රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව*
04	දේශණ ශාලාව A	377.5	2016	
05	දේශන ශාලාව B		2016	
06	දේශන කාමර A	159.7	2016	
07	දේශන කාමර B		2016	
08	ශ්‍රවණාගාරය (නවීකරණය කරනු ලබන)	63.3	ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතී.	
09	කියවීම් ශාලාව	14.21	2014.07.30 දින විවෘත කරන ලදී	ඇලෙක්සිස් කන්ස්ට්‍රක්ෂන් පුද්. සමාගම/ දිස්ත්‍රික් ලේකම් -අම්පාර
10	ආපන ශාලාව	15.05		අර්ජුන ඉංජිනියරින් කන්ස්ට්‍රක්ෂන් පුද්. සමාගම/ දිස්ත්‍රික් ලේකම් -අම්පාර
11	පොල්ලෙබැද්ද නිවාස ව්‍යාපෘතිය	6.45		දිස්ත්‍රික් ලේකම් -අම්පාර/ ප්‍රාදේශීය ලේකම්- මහඔය

2014 දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන හා ප්‍රදර්ශනය

මෙම ව්‍යාපෘතිය දැයට කිරුළ ප්‍රදර්ශනය සංවිධානය කිරීම හා දැයට කිරුළ සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සාර්ථකව අවසන් කරන ලදී.

එම සංවර්ධන කටයුතු වයඹ පළාතේ පුත්තලම හා කුරුණෑගල දිස්ත්‍රික්කවල ද, සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්ක පාදක කරගෙන ගෙන සිදු කරන ලදී.

දැයට කිරුළ 2014 ප්‍රදර්ශනය කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය ප්‍රා.ලේ.කොට්ඨාශය මුල් කරගෙන පැවැත්විය. 2014 දැයට කිරුළ ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් ප්‍රගතිය පහතින් දැක්වේ.

	ගොඩනැගිල්ලේ නම	ඇස්තමේන්තුගත මුදල (රු.මි.)	නිම කිරීමට අපේක්ෂිත කාල වකවානුව	ඉදිකිරීම් කරන ආයතනය
01	වයඹ විශ්ව විද්‍යාලය - ශ්‍රවනාගාරය	250,000,000.00	නිම කර භාර දී ඇත.	රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
02	වයඹ විශ්ව විද්‍යාලය - නැනෝ තාක්ෂණ විද්‍යාගාර	30,000,000.00	නිම කර භාර දී ඇත.	රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
03	වයඹ විශ්ව විද්‍යාලය -ශිෂ්‍ය මධ්‍යස්ථානය	70,000,000.00	නිම කර භාර දී ඇත.	ශ්‍රී ලංකා නාවික හමුදාව
04	වයඹ විශ්ව විද්‍යාලය - ක්‍රීඩාගාරය	250,000,000.00	නිම කර භාර දී ඇත	රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව
05	වයඹ විශ්ව විද්‍යාලය-ජල සම්පාදන ව්‍යාපෘතිය	92,000,000.00	නිම කර භාර දී ඇත	
06	වයඹ විශ්ව විද්‍යාලය- සංවර්ධනය කළ වැව	5,000,000.00	නිම කර භාර දී ඇත	
07	වයඹ විශ්ව විද්‍යාලය - වොලිබෝල් ක්‍රීඩාපිටිය	2,050,000.00	නිම කර භාර දී ඇත	
08	කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලය - දෙමහල් පුස්තකාලය	17,000,000.00	නිම කර භාර දී ඇත	වයඹ ඉංජිනේරු දෙපාර්තමේන්තුව
09	කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලය - ශ්‍රවණාගාරය	140,160,000.00	නිම කර භාර දී ඇත	වයඹ ඉංජිනේරු දෙපාර්තමේන්තුව
10	කුලියාපිටිය කාර්මික විද්‍යාලය - පරිපාලන සංකීර්ණය	60,000,000.00	නිම කර භාර දී ඇත	
11	කුලියාපිටිය කාර්මික විද්‍යාලය - ජල සම්පාදන ව්‍යාපෘතිය	98,000,000.00	නිම කර භාර දී ඇත	

2015 දැයට කිරුළ

මෙම වසරේ දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය සහ සංවර්ධන වැඩසටහන ගාල්ල, මාතර, හම්බන්තොට සහ රත්නපුර යන දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙම ජාතික වැඩසටහනේ ප්‍රධාන කාර්යයන් අතර දැයට කිරුළ ප්‍රදර්ශනය හා එම සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම මෙම අමාත්‍යාංශයට පැවරී ඇත.

2015 දැයට කිරුළ වැඩසටහනෙහි ප්‍රදර්ශනය **මාතර කඹුරුගමුව, කොටවිලවත්ත සහ සරසවි පෙදෙස** යන ස්ථාන වලදී පැවැත්වීමට සැලසුම් කර ඇත.

කොටවිලවත්ත ප්‍රදර්ශන භූමියේ සිදුකරන ඉදිකිරීම් ප්‍රගතිය

	අයත් අමාත්‍යාංශය/ ආයතනය	යෝජිත ව්‍යාපෘතිය	ඇස්තමේන්තුගත මුදල (රු.මි.)	ඉදිකිරීම් කරන ආයතනය
01	සෞඛ්‍ය අමාත්‍යාංශය - රෝහල් පරිශ්‍රය	සය මහල් ශල්‍ය වාට්ටු සංකීර්ණය	179	CECB
		සය මහල් වෛද්‍ය වාට්ටු සංකීර්ණය	179	
		හෙද විදුහලේ නේවාසිකාගාර සංකීර්ණය	89	
		අවිවාහක වෛද්‍යවරුන්ගේ නිල නිවාස	140	
		මල අපවහන කාණු පද්ධතිය ඉදිකිරීම	80	
		හෙද විදුහලේ දේශන ශාලා සංකීර්ණය	60	
		හෙද විදුහලේ පරිපාලන ගොඩනැගිල්ල	49	
02	පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය	කොමසාරිස්තුමාගේ නිල නිවාසය	15	SEC
03	අධිකරණ අමාත්‍යාංශය	අධිකරණ සංකීර්ණය ඉදිකිරීම	50	
04	ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය	කොටවිලවත්ත හා සරසවි පෙදෙස ප්‍රදර්ශන භූමි ස්ථාන සඳහා ජල සම්බන්ධතා ලබා දීම	150	NWSDB
05	ජනාධිපති ලේකම් කාර්යාලය/ මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	දිස්ත්‍රික් පරිපාලන සංකීර්ණය ඉදිකිරීම (පළමු අදියර)	50	NAVY
		දිස්ත්‍රික් පරිපාලන සංකීර්ණය ඉදිකිරීම (දෙවන අදියර)	250	UDA
06	පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය	කසළ කළමනාකරණය ආශ්‍රිත සංවර්ධනය කිරීම	40	පරිසරඅමා./ Bio Green
07	දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව	සෞඛ්‍ය පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම	43	පළාත් ඉංජිනේරු සේවා දෙපා.
08	දකුණු පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය	කනංකදෙණිය වැව ප්‍රතිසංස්කරණය කිරීම	4	පළාත් වාරිමාර්ග අමා.

සරසවි පෙදෙස ප්‍රදර්ශන භූමියේ සිදුකරන ඉදිකිරීම් ප්‍රගතිය

	අයත් අමාත්‍යාංශය/ ආයතනය	යෝජිත ව්‍යාපෘතිය	ඇස්තමේන්තුගත මුදල (රු.මි.)	ඉදිකිරීම් කරන ආයතනය
01	අධ්‍යාපන අමාත්‍යාංශය - මහින්ද රාජපක්ෂ විද්‍යාලය	135 x 30 තෙමහල් පන්ති කාමර ගොඩනැගිල්ල	44	**CECB**
		මීටර් 400 ධාවන පථය සහිත ක්‍රීඩා පිටිය	25	
		තෙමහල් විද්‍යාගාර සහ පරිපාලන ගොඩනැගිල්ල	38	

ප්‍රදර්ශනයට සමගාමීව භූමියෙන් පිටත මාතර දිස්ත්‍රික්කය තුළ සිදුකරන ඉදිකිරීම්

	අයත් අමාත්‍යාංශය/ ආයතනය	යෝජිත ව්‍යාපෘතිය	ඇස්තමේන්තුගත මුදල (රු.මි.)	ඉදිකිරීම් කරන ආයතනය
1	දකුණු පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය	කඹුරුගමුව වැව ප්‍රතිසංස්කරණය කිරීම	2	පළාත් වාරිමාර්ග අමා.
2	මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	මාතර දිස්ත්‍රික් නගර සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීම	300	UDA
3		මාතර තානායම ප්‍රතිසංස්කරණය	8	
4		මාර/ සුජාතා බාලිකා මහා විද්‍යාලයීය ශිෂ්‍යාවන් සඳහා වැසිකිළි ඒකකය ඉදිකිරීම	3	මාතර දිස්ත්‍රික් ලේකම්
5		දෙවිනුවර පරම විචිත්‍රාරාම රජමහා විහාරයේ ඉදිකිරීමට යෝජිත අභිනව සංඝාවාසය සහ දාන ශාලාව	19	මාතර දිස්ත්‍රික් ලේකම්
6		හක්මණ තැපැල් කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම	10	
7		හක්මණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව පරිපාලන සංකීර්ණයක් ඉදිකිරීම	20	
8		වෙහෙරහේන පූජා භූමිය සංවර්ධනය කිරීම	10	
9		වැවුරුකන්නල වැව ප්‍රතිසංස්කරණය කිරීම	20	
10	සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය	මාතර දිස්ත්‍රික් සංස්කෘතික යටිතල පහසුකම් සංවර්ධනය	40	CECB

2013 දැයට කිරුළ වැඩසටහනට සමගාමීව හාඩි උසස් තාක්ෂණ ආයතනයේ ඉදිකිරීම්





දේශණ ශාලා A සහ B





ශ්‍රවණාගාරය



නේවාසිකාගාරය



ආපනශාලාව

විදුලි සංදේශ දෙපාර්තමේන්තුව
(ඈවර කරමින් පවතී)

විදුලි සංදේශ දෙපාර්තමේන්තුව
(ඇවර කරමින් පවතී)

හැඳින්වීම

දැනට මෙම දෙපාර්තමේන්තුවෙන් ඇවර කිරීමේ කටයුතුවලට අමතරව පැරණි සේවකයින්ගේ ආයතනික කටයුතු සිදු කිරීම කරනු ලබයි. එසේම පැරණි දෙපාර්තමේන්තු සේවකයින්ගේ ආයතනික කටයුතු ඇතුළත් මහජන සේවාවන් ඉටු කිරීම හා විදුලි සංදේශ ආඥා පනතෙහි හා 1991 අංක 25 දරණ විදුලි සංදේශ පනතෙහි සමහර විධිවිධාන ක්‍රියාත්මක කිරීම කරනු ලැබේ.

බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ගේ නිර්දේශයන් අනුව බෞද්ධ සිද්ධස්ථානවලටද, ක්‍රිස්තියානි කටයුතු පිලිබඳ දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් මත ක්‍රිස්තියානි ආගමික ස්ථානවලට ද නව දුරකථන සබඳතා සහ දැනට ස්ථාපිත දුරකථන වලට සහන ගාස්තු ලබාදීමට කටයුතු කර ඇත.

ඒ ඒ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නිර්දේශයන් මත මුදල් රෙගුලාසි 846/847 ට අනුකූලව රාජකාරී කාර්යාල දුරකථන පහසුකම් ලබාදීම, රාජකාරී නිවාස දුරකථන පහසුකම් ලබාදීම සහ රාජකාරී නිවාස දුරකථන පෞද්ගලික දුරකථන බවට පරිවර්තනය කිරීම සිදුවිය.

මූල්‍ය ප්‍රගතිය




අමාත්‍යාංශයෙහි මූල්‍ය ප්‍රගතිය

හැදින්වීම

අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ මෙහෙයුම් වැඩසටහන සහ සංවර්ධන වැඩසටහන යන ප්‍රධාන වැඩසටහන් දෙකක් සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් වේ.
2014 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු මඟින් වැය ශීර්ෂ අංක 185 යටතේ මෙම අමාත්‍යාංශය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන සහ දරණු ලද වියදම් පිළිබඳ විස්තරය පහත පරිදි වේ.

2014 වර්ෂයේ අමාත්‍යාංශයේ අයවැය

වියදම් කාණ්ඩය	2014	
	වෙන් කර ඇති මුදල (රු. මී.)	සත්‍ය වියදම (රු.මී.)
පුනරාවර්තන වියදම්	208.78	183.94
මූලධන වියදම්	1509.22	950.80
එකතුව	**1,718.00**	**1134.74**



2014 අයවැය - සාරාංශ සටහන

විස්තරය	2014 අයවැය (රු) (ප්‍රතිශෝධිත)	2014 දෙසැම්බර් දක්වා වියදම (රු)
පුනරාවර්ථන වියදම්	**208,783,730.00**	**183,935,919.00**
- මෙහෙයුම් කටයුතු	99,983,730.00	92,766,713.52
- සංවර්ධන කටයුතු	108,800,000.00	91,169,205.04
මූලධන වියදම්	**1,509,216,270.00**	**950,808,361.00**
- මෙහෙයුම් කටයුතු	155,616,270.00	144,871,738.87
- සංවර්ධන කටයුතු	1,353,600,000.00	805,936,622.53
සමස්ථ වියදම	**1,718,000,000.00**	**1,134,744,279.96**

අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ මෙහෙයුම් වැඩසටහන සඳහා පුනරාවර්තන සහ මූලධන වියදම් විස්තරය

මෙහෙයුම් වැඩසටහන
ව්‍යාපෘතිය 01 - අමාත්‍ය කාර්යාලය

වැය විෂය	වැය විෂය විස්තරය	2014 අයවැය (රු) (ප්‍රතිශෝධිත)	2014 දෙසැම්බර් 31 දක්වා වියදම (රු)
	පුනරාවර්තන වියදම්	**42,696,800.00**	**36,450,945.87**
	පුද්ගල පඩිනඩි	**13,850,075.00**	**12,463,964.77**
1001	වැටුප් හා වේතන	7,000,000.00	6,049,166.91
1002	අතිකාල හා නිවාඩු දින වැටුප්	2,000,000.00	1,564,729.05
1003	වෙනත් දීමනා	4,850,075.00	4,850,068.81
	ගමන් වියදම්	**3,225,000.00**	**3,041,444.50**
1101	දේශීය	925,000.00	784,472.50
1102	විදේශීය	2,300,000.00	2,256,972.00
	සැපයීම්	**9,199,925.00**	**7,967,240.77**
1201	ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා	500,000.00	495,315.44
1202	ඉන්ධන	8,600,000.00	7,372,329.33
1203	ආහාර පාන හා නිල ඇඳුම්	99,925.00	99,596.00
	නඩත්තු වියදම්	**4,575,000.00**	**2,728,627.72**
1301	වාහන	4,375,000.00	2,563,080.67
1302	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	200,000.00	165,547.05
1303	ගොඩනැගිලි හා ඉදිකිරීම්	0.00	0.00
	සේවා	**11,846,800.00**	**10,249,668.11**
1401	ප්‍රවාහන	3,796,800.00	3,796,706.45
1402	තැපැල් හා සන්නිවේදන	1,400,000.00	1,128,386.58
1403	විදුලිය සහ ජලය	3,150,000.00	2,400,529.69
1405	වෙනත්	3,500,000.00	2,924,045.39
	මූලධන වියදම්	**18,250,000.00**	**11,965,174.83**
	පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම්	**13,550,000.00**	**10,059,289.57**
2001	ගොඩනැගිලි හා ඉදිකිරීම්	5,150,000.00	3,748,699.07
2002	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	400,000.00	277,063.04
2003	වාහන	8,000,000.00	6,033,527.46
	මූලධන වත්කම් අත්පත් කරගැනීම	**4,700,000.00**	**1,905,885.26**
2102	ගෘහභාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ	2,550,000.00	1,034,590.26
2103	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	2,150,000.00	871,295.00
	මුළු වියදම	**60,946,800.00**	**48,416,120.70**

මෙහෙයුම් වැඩසටහන


ව්‍යාපෘතිය 02 - පරිපාලන හා ආයතනික සේවා

වැය විෂය	වැය විෂය විස්තරය	2014අයවැය (රු) (ප්‍රතිශෝධිත)	2014 දෙසැම්බර් දක්වා වියදම (රු)
	පුනරාවර්තන වියදම්	**57,181,680.00**	**56,315,767.65**
	පුද්ගල පඩිනඩි	**21,426,380.00**	**21,352,918.37**
1001	වැටුප් හා වේතන	12,000,000.00	11,931,961.64
1002	අතිකාල හා නිවාඩු දින දීමනා	1,105,250.00	1,105,231.04
1003	වෙනත් දීමනා	8,321,130.00	8,315,725.69
	ගමන්වියදම්	**1,708,127.00**	**1,672,812.50**
1101	දේශීය	173,620.00	154,302.00
1102	විදේශීය	1,534,507.00	1,518,510.50
	සැපයීම්	**4,681,500.00**	**4,666,649.06**
1201	ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා	895,000.00	894,724.06
1202	ඉන්ධන	3,500,000.00	3,492,442.00
1203	ආහාර පාන හා නිල ඇඳුම්	286,500.00	279,483.00
	නඩත්තුවියදම්	**2,643,500.00**	**2,643,450.65**
1301	වාහන	2,286,800.00	2,286,783.93
1302	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	356,700.00	356,666.72
	සේවා	**26,327,423.00**	**25,743,141.32**
1401	ප්‍රවාහන	56,200.00	56,035.50
1402	තැපැල් හා සන්නිවේදන	1,588,450.00	1,588,420.73
1403	විදුලිය සහ ජලය	4,445,280.00	3,861,868.88
1404	කුලී සහ වරිපනම් බදු	17,473,493.00	17,473,344.00
1405	වෙනත්	2,764,000.00	2,763,472.21
	පැවරුම්	**500,000.00**	**236,795.75**
1506	රජයේ සේවකයින් සඳහා දේපල ණය පොලී	500,000.00	236,795.75
	මූලධන වියදම්	**137,366,270.00**	**132,906,564.04**
	පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම්	**3,616,270.00**	**2,884,557.41**
2001	ගොඩනැගිලි හා ඉදිකිරීම්	500,000.00	500,000.00
2002	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	516,270.00	516,261.97
2003	වාහන	2,600,000.00	1,868,295.44
	මූලධන වත්කම් අත්පත් කරගැනීම	**2,950,000.00**	**2,464,876.64**
2101	වාහන	200,000.00	200,000.00
2102	ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණය	1,000,000.00	639,285.64
2103	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	1,650,000.00	1,625,591.00
2104	ගොඩනැගිලි හා සැකසුම්	100,000.00	0.00
	දැයට කිරුළ	**130,000,000.00**	**127,075,000.00**
1-2-2 2104	**ගොඩනැගිලි (දැයට කිරුළ - අම්පාර)**	130,000,000.00	127,075,000.00
	මානව සම්පත් සංවර්ධනය	**800,000.00**	**482,129.99**
2401	කාර්ය මණ්ඩලය පුහුණු කිරීම	800,000.00	482,129.99
	මුළු වියදම	**194,653,200.00**	**189,222,331.69**

අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ සංවර්ධන වැඩසටහනේ පුනරාවර්තන සහ මූලධන වියදම් විස්තරය

සංවර්ධන වැඩසටහන
ව්‍යාපෘතිය 03 - තොරතුරු තාක්ෂණ සංවර්ධනය

වැය විෂය	වැය විෂය විස්තරය	2014 අයවැය (රු) (ප්‍රතිශෝධිත)	2014 දෙසැ. දක්වා වියදම (රු)
	පුනරාවර්තන වියදම්	**108,800,000.00**	**91,169,205.04**
185-2-3-2-1405	වෙනත් - තොරතුරු තාක්ෂණ උද්‍යාන - යාපනය	5,000,000.00	4,519,580.55
185-2-3-3-1405	වෙනත් - තොරතුරු තාක්ෂණ උද්‍යාන - මන්නාරම	4,000,000.00	2,964,999.96
185-2-3-4-1405	වෙනත් -දැයට කිරුළ	99,800,000.00	83,684,624.53
	මූලධන වියදම්	**1,353,600,000.00**	**805,936,622.53**
185-2-3-1-2502	ආයෝජන -පාසල් පරිගණක විද්‍යාගාර ඉදිකිරීම	700,000,000.00	510,169,034.68
185-2-3-2-2502	ආයෝජන -තොරතුරු තාක්ෂණ උද්‍යානය - යාපනය	2,500,000.00	1,624,815.50
185-2-3-3-2502	ආයෝජන -තොරතුරු තාක්ෂණ උද්‍යානය - මන්නාරම	1,100,000.00	1,098,306.87
185-2-3-6-2502	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය - නැණසල 2013	100,000,000.00	100,000,000.00
185-2-3-7-2502	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය- නැණසල 2014	550,000,000.00	193,044,465.48
	එකතුව	**1,462,400,000.00**	**897,105,827.57**



විදුලි සංදේශ හා කොරකුරු කාක්ෂණ අමාත්‍යාංශය
අංක. 79/1, 5 වන පටුමග,
කොළඹ - 03,
දුරකතන: 011-2577777

தொலைத் தொடர்பாடல் மற்றும் தகவல் தொழில்நுட்பவியல் அமைச்சு
இல. 79/1, 5 வது ஒழுங்கை,
கொழும்பு - 03,
தொலைபேசி: 011-2577777

Ministry of Telecommunication and Information Technology
No. 79/1, 5th Lane,
Colombo - 03,
Telephone: 011-2577777